# 01. පරිච්ඡේදය

## 1. හැඳින්වීම

ජනමාධ්‍ය වූ කලි ජනතාවගේ එදිනෙදා ජීවිතය හා සම්බන්ධ අත්‍යවශ්‍ය කරුණක් බවට අද පත්ව ඇත්තේ ඒ හරහා තොරතුරු, විනෝදාස්වාදය, පෙළඹවීම ආදි සියල්ලම ලබා දෙන බැවිනි. තොරතුරු දැනගැනීම උදෙසා ජනමාධ්‍ය භාවිතයේදී රූපවාහිනිය, ගුවන්විදුලිය වැනි විද්‍යුත් මාධ්‍යය වලට අමතරව පුවත්පත  අතීතයේ සිටම ජනතාව පරිභෝජනය කරති. එදිනෙදා රටේ හා ලෝකය තුළ සිදුවන සිදුවීම් සාමාන්‍ය පුවත් වාර්තාකරණය හරහා ජනතාව දැනගන්නා අතර තව දුරටත් එම සිදුවීම්වල සුළ මුල දැනගන්නට ග්‍රාහකයා කුතුහලයෙන් ජනමාධ්‍ය භාවිතා කරයි.

සාමාන්‍ය ප්‍රවෘත්ති වාර්තාකරණයක් හරහා අප දකින්නේ තොරතුරු මතුපිටින් පමණක් අතගා බැලීමකි. වාර්තා කිරීමකි. නමුත් ඉන් ඔබ්බට ගොස් පුවතක් පිළිබඳව ගැඹුරින් සොයා බැලීම ගවේෂණාත්මක ප්‍රවෘත්ති වාර්තාකරණයෙදී සිදුවේ. එම නිසාම අද වන විට ගවේෂණාත්මක ප්‍රවෘත්ති වාර්තාකරණයට විශාල සමාජ පිළිගැනීමක් ලැබී තිබේ. ජනතාවගේ පුවත් කුතුල සංසිදුවීමට අද වන විට වෙන කවරදාටත් වඩා ගවේෂණාත්මක ප්‍රවෘත්ති වාර්තාකරණය සමාජයට අත්‍යවශ්‍ය වී ඇත.

වාර්තාකරණය නැමති ඔටුන්නේ ඇති සියලු මැණික් අතර, ඇති වූඩා මාණික්‍යය ලෙස සැලකිය හැක්කේ ගවේෂණාත්මක වාර්තාකරණයයි.[1]

ගවේෂණාත්මක මාධ්‍යවේදීහු රහස් හෙළිකරමින්, අසත්‍යයන් සහ බොරුකාරයන් හෙළිකරමින්, අපහසුතාවක් ඇති කරුණු විකෘති කරමින්, වාරණය මග හරිමින් තවත් විටෙක තම ජීවිතය පවා අනතුරේ යොදා ගනිමින් ඇසූ දුටු සාක්ෂිකරුවන් බවට පත්වෙමින් තම උපරිම ශක්තියෙන් ජනතාවගේ වුවමනාවන්ට සේවය කරති.[2]

---

1. අයිවන් වික්ටර්, පෑන අහිංසක ද, රාවය ප්‍රකාශන, 2009, පිටුව 98
2. දේශප්‍රිය සුනන්ද, ජැක් ලයින් පාර්ක්, ඉරා කඩතිර, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

මෙහිදී පුවතකට වඩා වැඩි යමක් ගැඹුරින් දැක්වීම හරහා ගවේෂණාත්මක වාර්තාකරුවා සමාජ මෙහෙවරක් ඉටු කරයි. සමාජයේ පවතින දූෂණ, වංචා ආදිය පෙන්වා දෙමින් සමාජයේ ජනතාවට අවශ්‍යය කරන යහපත් සමාජයක් ගොඩ නැංවීමට මෙහිදී අපේක්ෂා කෙරේ.

ගවේෂණාත්මක වාර්තා මඟින් එක් පුද්ගලයෙකුගේ, ආණ්ඩුවක හා ආයතනයක රහස් වූවමනාවන් හෝ ක්‍රියාවන් හෝ බොහෝ විට හෙළිදරව් කරන්නේ රහසිගත ක්‍රියාවලියට හෝ තියුණු ගවේෂණයක ප්‍රතිඵල මගිනි.[3]

කෙසේ වුවත් ගවේෂණාත්මක පුවත් වාර්තාකරණයක් වූ කලී, වාර්තාකරණ ජනමාධ්‍යවේදියාගේම ස්වාධීන ගවේෂණයක් වීම, පොදු ජනතාවට වසන් කර තිබෙන හෝ වසන් කිරීමට උත්සහ කරන හෝ වැදගත් කරුණක් ගැන විය යුතුය. කරනු ලබන ගවේෂණය හා ඒ ආශ්‍රයෙන් කරන වාර්තාකරණය පාඨකයාගේ හෝ මහජන උනන්දුවට හේතුවන මහජන වැදගත්කමක් ඇති දෙයක් විය යුතුය.[4]

අද වන විට ගවේෂණාත්මක ප්‍රවෘත්ති වාර්තාකරණය ඉතා ජනප්‍රිය හා පිළිගැනීමකට ලක්වී ඇති නිසාම බොහෝ මාධ්‍යවේදීන් සිතාමතා ද ගවේෂණාත්මක වාර්තා ඉදිරිපත් කරන ප්‍රවණතාවයක් දක්නට ලැබේ. ගවේෂණය හරහා තොරතුරු හොඳ ඉවකින් රැස්කිරීම හරහා ජනමාධ්‍ය තුළ ප්‍රබල වාර්තාකරණයක් ලෙස ගවේෂණාත්මක වාර්තාකරණය හඳුනාගෙන ඇත.

අද වන විට ගවේෂණාත්මක වාර්තාකරණයක් ලෙස බොහෝ සිදුවීම් අනාවරණ සිදුවූවත් එහිදී නිසි ආකාරයට වූ ගවේෂණාත්මක වාර්තාකරණ වෙනුවට හුදු දේශපාලන අරමුණු මත පිහිටා ගවේෂණාත්මක ලෙස උලුප්පා දක්වමින් යම් වාර්තා කිරීම් පමණක් දක්නට ලැබේ.

කෙසේ වුවද මෙම ගවේෂණාත්මක වාර්තා කරන හරහා බොහෝ විට සිදුවන්නේ

3. දේශප්‍රිය සුනන්ද, ජැක් ලයින් පාර්ක්, ඉරා කඩතිර, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
4. - එම -

දේශපාලනයට සම්බන්ධ පුද්ගලයන් ආදීන් මහජනතාවගෙන් වසන් කරන්නා වූ සිද්ධීන් හෙළිදරව් කිරීමය. මෙහිදී දේශපාලනය ජනමාධ්‍යයට බලපාන්නා වූ ආකාරය වන අධිපතිවාදීව ජනමාධ්‍ය පාලනය හරහා හිමිකාරීත්වය මගින් ආදී වශයෙන් ජනමාධ්‍යයට බලපෑම් කිරීමට දේශපාලනය කටයුතු කරයි. තමන්ගේ දූෂණ වංචාවන් හෙළිවීම වැළැක්වීමෙහිලා ඔවුන් තම ආධිපත්‍ය මගින් මේ ආකාරයට මාධ්‍ය පාලනය කරයි. ඒ මඟින් ජනමාධ්‍ය ආයතනවලට පහරදීම, මාධ්‍යවේදීන් අත්අඩංගුවට ගැනීම, ඝාතනය කිරීම පවා සිදුකරනු ලැබේ.

එමෙන්ම මාධ්‍ය මඟින්ද තමන්ගේ ආයතන හිමිකාරීත්වය මත පදනම් වූ දේශපාලනයක් මත වාර්තාකිරීම් දක්නට ලැබේ. එය පුද්ගලික පලිගැනීම් දක්වා වුවද වර්ධනය විය හැකිය. අතීතයේ පටන්ම ජනමාධ්‍යයෙහි ගවේෂණාත්මක ප්‍රවෘත්ති වාර්තාකරණය හා දේශපාලනය අතර සුහදතාවක් දක්නට නොවීය.

මෙම නිබන්ධනයේදී දේශපාලනය ජනමාධ්‍ය කෙරේ කරනු ලබන බලපෑම අනුව ගවේෂණාත්මක වාර්තාකරණය කෙරෙහි දේශපාලන බලපෑම එල්ල වන ආකාරය සලකා බැලීමට අපේක්ෂා කෙරේ. මාධ්‍ය කෙරෙහි දේශපාලනය බලපාන ආකාරය සම්බන්ධව සැලකීමේදී ජන සන්නිවේදනය සංකල්ප හා ජනමාධ්‍ය පිළිබඳ මාක්ස්වාදී මතය මගින් අවධානය යොමුකරනු ලැබේ.

ඒ අනුව මෙහිදී පුවත්පත් මාධ්‍ය තුල බිහි වූ ගවේෂණාත්මක වාර්තා අතරින් ඉහල මට්ටමේ ලා සැලකිය හැකි යැයි අදහස් කරන ගවේෂණාත්මක වාර්තාකරණ දෙකක් තෝරාගෙන ඒවා කෙරෙහි දේශපාලනය බලපා ඇති ආකාරය පිළිබඳව සිද්ධි අධ්‍යයනයක් මගින් අන්තර්ගත විශ්ලේෂණය කිරීමට අපේක්ෂා කෙරේ.

ගවේෂණාත්මක ප්‍රවෘත්ති වාර්තාකරණයේ ස්වභාවය හඳුනාගැනීම, එය ආරම්භ වූ ආකාරය එහි ඉතිහාසය, වත්මනදී ක්‍රියාත්මක වන ආකාරයත්, නිවැරදිව ගවේෂණාත්මක වාර්තාකරණය සිදුවන වාද යන්නත් ගවේෂණාත්මක වාර්තාකරණයට දේශපාලන බලපෑම් ඇතිවන ආකාරයත් සොයා බැලීම මෙහි අභිමතාර්ථ අතර වේ.

ගවේෂණාත්මක වාර්තාකරණය පිළිබඳව විවිධ පුද්ගලයන් විසින් පුවත්පත් කලාවට අදාල කෘතිවලදී අදහස් දක්වා තිබුණත්, ගවේෂණාත්මක වාර්තාකරණයට අදාළව දේශපාලනය සමඟ එහි ඇති සබඳතාව දේශපාලන බලපෑම පිළිබඳව පොත්පත් ලියවී ඇත්තේ අවම වශයෙනි. ඒවාද මූලාශ්‍ර කොටගෙන මෙම නිබන්ධනය ද ගවේෂණාත්මක පුවත්කලාවට ඇති දේශපාලන න්‍යාය පත්‍ර භාවිතය පිළිබඳ අධ්‍යයනයක් කොට ඇත.

මෙම මාතෘකාවේ වැදගත්කම හරහා මාගේ ඉදිරි අධ්‍යයන කටයුතුවලට දායකත්වය මෙන්ම ගවේෂණාත්මක වාර්තාකරණය පිළිබඳව ඇති රුචිය මගින් මෙම නිබන්ධනය ඉදිරි ප්‍රයෝජනය උදෙසා මනා දායකත්වයක් කර ගැනීමට අපේක්ෂා කරමි.